1st Place Winner
National Productivity
Award 2020

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය எமது இல. My Ref.	CSS/03/13/CIR.COM.(3)	ඔබේ අංකය உமது இல. Your Ref.		දිනය திகதி Date	2026.10.26

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව දකුණු පළාත් සභාව සඳහා වක්‍රලේඛ අදාළ කර ගැනීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/SP/01/01/01/01(i) හා 2026.10.22 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති වක්‍රලේඛය, වක්‍රලේඛය නිකුත් කළ දින සිට දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා 2026. 10.22 දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

අනු අංකය	වක්‍රලේඛය නිකුත් කළ ආයතනය	වක්‍රලේඛ අංකය	නිකුත් කළ දිනය	වක්‍රලේඛයේ ශීර්ෂය
01.	රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ 04/2017	2017.02.28	ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ යටතේ පවතින අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary
091 2222603

කාර්යාලය
அலுவலகம்
Office
091 4119011
091 2234052

091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk

එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
S.H. Dahanayaka Mawatha, Galle.
எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

මගේ අංකය / எனது இல. / My Number	GS/SP/01/01/01/01(i)	ඔබේ අංකය / உமது இல. / Your Number	CSS/03/13/CIR.COM.(3)	දිනය / திகதி / Date	2026.10. 22

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.



පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව

දකුණු පළාත් සභාව සඳහා වක්‍රලේඛ අදාළ කර ගැනීම

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද ඔබේ සමාංක හා 2026.10.19 දිනැති ලිපි හා බැඳේ.

02. ඒ අනුව පහත දැක්වෙන වක්‍රලේඛ, අනු අංක 01 සිට අනු අංක 08 දක්වා එය නිකුත් කළ දින සිට බලාත්මක වන පරිදි, දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහාත්, අනු අංක 09 දරණ වක්‍රලේඛය දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2026.10.21 වැනි දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

අනු අංකය	වක්‍රලේඛ අංකය හා දිනය	වක්‍රලේඛයෙහි සඳහන් විස්තරය
01	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 04/2017 – 2017.02.28	ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම.
02	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 04/2017 (I) – 2017.08.10	
03	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 04/2017 (III) – 2017.09.07	
04	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 25/2014 - 2014.11.12	තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.
05	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 25/2014 (I)– 2014.12.29	
06	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 25/2014 (II) – 2016.04.04	
07	රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ: 29/2019 – 2019.09.18	තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයන් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල.
දුරකතන : 091-2234480
ෆැක්ස්: 091-2229811
ඊ-මේල්: governsecspc@sltnet.lk
වෙබ අඩවිය: governor.sp.gov.lk

முகவரி: கீழ் டிக்சன் வீதி, காலி.
தொலைபேசி: 091-2234480
தொலைநகல்: 091-2229811
மின்-அஞ்சல்: governsecspc@sltnet.lk
இணையதளம்: governor.sp.gov.lk

Address : Lower Dikson Road, Galle.
Telephone : 091-2234480
Fax: 091-2229811
e-mail: governsecspc@sltnet.lk
Website: governor.sp.gov.lk

අනු අංකය	චක්‍රලේඛ අංකය හා දිනය	චක්‍රලේඛයෙහි සඳහන් විස්තරය
08	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 01/2024 -- 2024.04.16	වයස අවුරුදු 45න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයන් වෙත විශ්‍රාම වැටුප් ලබාදීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014,25/2014(I)සහ 29/2019 සම්බන්ධයෙනි.
09	සෞඛ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛ: 01 - 44/2026 - 2026.10.02	Certification of Thalassaemia Patients for Monthly Financial Assistance

03. ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද ඉහත චක්‍රලේඛයන්හි පිටපත් 01 බැගින් මේ සමග අමුණා ඔබ වෙත කාරුණිකව ඉදිරිපත් කරමි.

කේ.පී.එස්.දමයන්ති
පරිපාලන නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2017

මෙම රාජ්‍ය පරිපාලන
චක්‍ර .04./.2017..චක්‍රලේඛය,
උපදෙස් පිළිබඳ 2017/2/28 දින සිට දැනුම්දීම
පළාත්සභාවට අදාල කර ගැනීම
සඳහා ගරු අණ්ඩුකාරතුමන්ගේ
අනුමැතිය 2024/10/28 දින ලබා දී ඇති බව
සහතික කරමි.

ආණ්ඩුකාර ලේකම්/සහකාර ලේකම්/ අ.ද.

මගේ අංකය: EST-7/ALLOW/04/2060-3
රාජ්‍ය පරිපාලන සහ
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2017.02.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම

ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2000.07.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000හි පළමුවන ඡේදයේ සඳහන් සියලුම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2000 හා එයට සංශෝධන ලෙස නිකුත් කරන ලද සියලුම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2017.03.15 දින සිට අවලංගු කරන අතර ඒ වෙනුවට පහත සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය.

02. ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික විද්‍යාල සහ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාසල්වල ක්‍රියාත්මක වන පරිගණක විද්‍යාගාර, කලාප පරිගණක සම්පත් මධ්‍යස්ථාන, පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන වැනි රාජ්‍ය පුහුණු ආයතනවල පාඨමාලා හදාරා සුදුසුකම් ලත් සිසු සිසුවියන් හා විශ්ව විද්‍යාලවල උපාධි පාඨමාලා හදාරන දෙවන, තුන්වන හා හතරවන වසරවල උපාධි අපේක්ෂක/අපේක්ෂිකාවන් වෙනුවෙන් ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමේ බලය සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට, පළාත් ප්‍රධාන ලේකම්වරුන්ට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට පවරනු ලැබේ.

03. උපාධිධාරීන් මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදන යටතේ අභ්‍යාසලාභී පුහුණුවට ඇතුළත් කර නොගැනීමට සහ/හෝ කිසිම හේතුවක් මත පුහුණුවන අභ්‍යාසලාභීන් උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු පුහුණුවන්නන් ලෙස රඳවා නොගැනීමට ක්‍රියා කළ යුතුය.

04. පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව උපරිමය 25ක් හෝ සමස්ත සේවක සංඛ්‍යාවෙන් 10%ක් යන දෙකින් අවම සංඛ්‍යාවට සීමා කළ යුතුය.

05. ඒ අනුව ප්‍රායෝගික පුහුණුව ලබාදීමට අදහස් කරන සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය අනුව සකස්කර පිටපත් 02කින් යුක්තව සම්පූර්ණ කොට දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ අදාළ බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. මෙහි 08 ඡේදය යටතේ දක්වා ඇති තාක්ෂණික ගණයේ ප්‍රායෝගික පුහුණුවක් හැර අනිකුත් සියලුම ප්‍රායෝගික පුහුණුවීම් අනිවාර්යයෙන්ම මාස 06කට සීමා කළ යුතු අතර, කිසිදු හේතුවක් නිසා හෝ එකී කාලසීමාව ඉක්මවා දීමනා නොගෙවිය යුතුය.

07. අවශ්‍ය ප්‍රතිපාදන සැලසී ඇත්තේ නම් පමණක් පුහුණුලාභියෙකුට දෛනිකව රු.500/-ක දීමනාවක් ගෙවිය හැකි අතර, ඊට අමතරව වෙනත් කිසිදු දීමනාවක් හෝ පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතුය. එමෙන්ම මෙම දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ අතිරේක මුදල් ප්‍රතිපාදන නොඉල්ලීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතුය.

08. මාස 06කට වැඩි ප්‍රායෝගික පුහුණු කාලයක් ලබාදිය යුතු පාඨමාලා ලෙස දැනට හඳුනාගෙන ඇත්තේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හා ඊට අනුබද්ධ කටුනායක තාක්ෂණඥයන් පුහුණු කිරීමේ ආයතනය, මොරටුව ආධුනික පුහුණු කිරීමේ ආයතනය සහ ශ්‍රී ලංකා මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු ආයතනය යන ආයතනයන්හි පවත්වාගෙන යන තාක්ෂණික පාඨමාලාවන් පමණකි. එම පුහුණුව ද පාඨමාලාවේ නිර්දේශිත ප්‍රායෝගික පුහුණු කාලසීමාව නොඉක්මවිය යුතුය.

09. පුහුණුවන්නන් පුහුණුව සඳහා ආයතනයකට අනුයුක්ත කිරීමේ දී ඔවුනට ආයතනයේ කිසියම් තනතුරක වගකීම් නොපැවරිය යුතුය.

10. ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට රජයේ ස්ථිර හෝ ස්ථිර නොවන සේවකයින් සඳහා හිමි කිසිදු වරප්‍රසාදයක් හිමි නොවන බව පැහැදිලිවම ලිඛිතව දැනුම් දිය යුතුය. තවද ප්‍රායෝගික පුහුණුව සඳහා ආවරණ අනුමතිය ලබා දීමක් ද නොකළ යුතුය.

11. මෙම පුහුණු ලබාදීම සම්බන්ධයෙන් අදාළ ආයතන හෝ පුහුණුව ලබන්නා සමඟ කිසිදු ගිවිසුමකට ඇතුළත් නොවිය යුතුය.

12. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය

ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා අයදුම්පත්‍රය

මගේ අංකය:- .....
දිනය : .....

අමාත්‍යාංශ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්
දිස්ත්‍රික් ලේකම්

I කොටස

01.
01:1 කාර්යාලය : .....
01:2 පුහුණුවට යොමු කරන ආයතනයේ නම : .....
01:3 යොමු අංකය හා දිනය : .....

02. පුහුණුව ලබාදීමට අදහස් කරන අභ්‍යාසලාභීන් පිළිබඳ විස්තර :

පුහුණුව ලබන්නාගේ නම (1)	විෂයය (2)	ආරම්භක දිනය (3)	අවසාන දිනය (4)	කාලය (මාස) (5)
I				
II				
III				
IV				
V				

03. ඉහත නම් සඳහන් ප්‍රායෝගික පුහුණුව ලබන්නන්ට ගෙවීම සඳහා ප්‍රතිපාදන ඇත/නැත.

ඉහත නම් සඳහන් පුහුණුවන්නන්ට එහි සඳහන් කාල සීමාව සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීම නිර්දේශ කරමි/නොකරමි. පුහුණුව ලබන දිනකට රු.500/-ක (පන්සියයක) දීමනාවක් ලබාදිය හැක/නොහැක.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන:.....
නම .....
තනතුර:.....

II කොටස

මගේ අංකය:.....
දිනය:.....

පළමුවන කොටසේ නම් සඳහන් පුහුණුවන්නන්ට ඊට ඉදිරියෙන් සඳහන් හයමසක (06)/ අවුරුදු ..... කාලය සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම අනුමත කරමි./නොකරමි. පුහුණුව ලබන එක් දිනකට රුපියල් 500/- (පන්සියය) බැගින් ගෙවීම අනුමත කරමි./නොකරමි.

.....
අමාත්‍යාංශ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්
දිස්ත්‍රික් ලේකම්